# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය
## දෙවන වාර පරීක්ෂණය - 2023
## 11 ශ්‍රේණිය
## 47 - සිංහල සාහිත්‍ය රසාස්වාදය

කාලය : පැය 03

## I - පත්‍රය

I පත්‍රයේ ඇති ප්‍රශ්න දෙක සඳහා ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයා වෙන ම භාර දෙන්න.

I (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා ඒවා ඇසුරෙන් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට කෙටි පිළිතුරු දී ඇති හිස්තැන්වල පමණක් ලියන්න.

**i. "එඹල ඒ තට අතවැසි කමට නිසි එකෙක් නොවෙයි. ඇඳුරුකමට නිස්සෝය."**

(අ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් ද ?

..........................................................................................................

(ආ) මෙම ප්‍රකාශය කළේ කා හටද ? ......................................................

**ii. " පරසිඳු <u>පබු දනන්</u> සෙව් පමණින් මහරු**
**බෙලෙනිඳු මද වුවත් නො කෙරෙති රුපුන් සරු**
**<u>බරණිඳු</u> ගෙල වසන නා රද වෙමින් ගරු**
**ගුරුළිඳු අතින් ඇසි කිම යහළු තොරතුරු"**

(අ) මෙහි අවසන් කවි පද දෙකෙහි අර්ථය ලියන්න.

..........................................................................................................

..........................................................................................................

(ආ) ඉරි ඇඳි පදවල අර්ථය වෙන වෙන ම ලියන්න.

..........................................................................................................

**iii. " තෙපි තුලුත් කරා ගොසින් නිදාන පාවා ගනුව."**

(අ) මෙහි තෙපි යනුවෙන් ආමන්ත්‍රණය කළේ කා හටද ?

..........................................................................................................

(ආ) මෙම ප්‍රකාශය අඩංගු කෘතිය කුමක් ද ? ......................................................

**iv. " හූම් හොඳ සීතල වතුර නේද?"**

(අ) මෙම ප්‍රකාශය අසා සිටියේ කවුරුන් ද ?

..........................................................................................................

(ආ) වෙරිවත්ත, මුහුදු ලිහිණියා යන නාට්‍ය රචනා කළේ කවුරුන් විසින් ද ?

..........................................................................................................

**v. " පලයං පලයං ගිහින් එක්ක වරෙන් "**

(අ) මෙය පැවසුවේ කා හට ද ?

..........................................................................................................

(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් ග්‍රන්ථය ලියූ කතුවරයාගේ වෙනත් කෘතියක් ලියා දක්වන්න.

..........................................................................................................

**(2) පහත දැක්වෙන ගද්‍ය පද්‍ය කොටස් දෙකෙන් එක් කොටසකට පමණක් පිළිතුරු ලියන්න.**

නන්ද කුමරු ද බුදුන් වහන්සේ කෙරෙහි ගෞරවයෙන් පාත්‍රය හැර ගත මැනව' යි නොකියා රජගෙන් වඩනා ගමන හෙයින් ගිණි හිස කෙරෙහි දී හැර ගන්නා සේකැයි සිතූහ. බුදුහු එතනදීත් පාත්‍රය හැර නොගත් සේක් ගිණි පාමුල දී හැර ගන්නා සේක් වනැයි සිතා යන කලට එතනදීත් හැර නොගත්හ. රඳනු කැමතිවත් අභිප්‍රායකින් ම නොව බුදුන් කෙරෙහි ගෞරවයෙන් පාත්‍රය හැර ගත මැනවයි කියාගත නොහී මෙතනදී හැර ගන්නා සේක. මෙතනීද හැර ගන්නා සේක් වනැයි සිතා ම නොසිතින් ගියත් සිතින්ම සසර ගමනින් නවත්නා හෙයින් මය. ඒ වේලෙහි නන්ද කුමරුවන්ගේ දනවූ කලණ නම් වූ කුමාරයන්ට සරණ නිල වූ මුල් නැකම කවරේ වුවත් රජකම් හෙයින් බැදැණියන් ළඟට මිනිස්සු ගොසින් බුදුහු පිය රජ්ජුරුවන්ගේ මාළිගාවට වැඩි ගමනේ මුඹ දැගෙන් වෙන් කොට නන්ද කුමරුන් වහන්සේ කැඳවා ගෙන වඩන සේකැයි කිවුය. ඒ බස් අසමින් ඕ ද හිස සෝධමින් සිටි තැනැත්තේ සෝධා නොනිමි හිසකේ නොබැඳ වහා අවුත් " ගියත් සුළු ගෙයි වහා එව" යි කිවූ ය. උන් කියාලු බස නන්ද කුමරුන් සිත දිවුල් ලාටු මුසු වයිති තර ව වැද ගන්නා සේ තරයේ ම වැදගත. බුදුහුත් පාත්‍රය අතින් නොගෙන වෙහෙරට ගෙන ගොසින් "නන්ද කුමරුනි, මහණ වවුදැ' යි විචාළ සේක. බුදුන් වදාළ බස මඟුලෙන් හෙළාලු කප උගුළුවාලන්ට බැරියා සේ උගුළුවා ලන්ට බැරි හෙයින් මහණ නොවෙමි' යි නොකියා යහපත මහණ වෙමි" යි කියා ගිවිස්සාහ.

i. නන්ද කුමාරයාගේ සිතෙහි බුදුන් කෙරෙහි පවත්නා ගෞරවය ප්‍රකාශ කරන නිදසුන් දෙකක් දක්වන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(ල. 04)

ii. තමා අත ඇති ප්‍රාත්‍රය බුදුන් වහන්සේ විසින් ආපසු ඉල්ලා ගනිති යි නන්ද කුමාරයා සිතූ අවස්ථා දෙකක් උපුටා දක්වා එහි අරුත් පැහැදිලි කරන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(ල. 04)

iii. නන්ද කුමරු බුදු රදුන් විසින් වෙහෙරට කැඳවාගෙන යන බව සැල වූ ජනපද කල්‍යාණිය කටයුතු කළ ආකාරය චිත්ත රූප මැවෙන ලෙස දක්වා ඇත. මේ පිළිබඳ පැහැදිලි කරන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(ල. 06)

iv. උක්ත පාඨයට අනුව කතුවරයාගේ අවස්ථෝචිත උපමා භාවිතය පිළිබඳව නිදසුන් දෙකක් ඇසුරෙන් පහදන්න.

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

(ල. 06)

නැතහොත්

ගන්තුන තුලාගේ අලියා වැටුණු වැවේ
සුන්දර හාමි එතරම් පොහොසතෙක් නොවේ
තුන් ලාහකම බිම් වැඩකර දියෙන් වැවේ
රන්වන් කරල් බර වී දැන් බිමට නැවේ

ඔහුගේ ගමට මා ගිය ඒ පළමු වර
තවමත් සිතේ ඇත අමතක නොවන යුර
හේනට ගොසින් ගෙන් හුවක් තරම දුර
එනවා දිටිමි මිටි බැඳගෙන වියලි දර

දර ටික තබා සෙවණැලි පලු ගසක යට
පිස දම දමා දාඩිය එන නළල පිට
මා එන තුරුම සිට පෙන් වූ සිනහ කට
තවමත් පෙනේ දුක් දොම්නස් අතර මට

පෙර දැක නොමැති මුත් සුන්දර හාමි විසින්
මගෙ තොරතුරු ඇසූ හැටි හිතවතකු ලෙසින්
ගෙඩියක් කඩාගෙන ගෙම්දුල තැඹිලි ගසින්
පිළිගැන්වීය මට සොම්නස පිරුණු ඇසින්

පොල් දෙහි දොඩම් ගස් තුන හතරකි ඇත්තේ
දුප්පත් කමයි හැම තැන ලකුණුව ඇත්තේ
කෙලෙස ද කියා කළ ගුණ සැලකිය යුත්තේ
දුන් සත පණහවත් ඔහු නැත පිළි ගත්තේ

ආගන්තුක ව එන කෙනෙකුට පුරුදු නැති
හිතවත් කමින් සැලකූ යුතුකමය සිතී
ඔහු වෙත මුදලකින් මා කළ හැටිය තුතී
සිහි වී කම්මුල් රතු පැහැය ගතී

i. මෙම පද්‍ය පන්තියේ වස්තු විෂය කෙටියෙන් ලියා දක්වන්න.

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

ii. මෙම පද්‍ය පන්තියෙහි ආකෘතිය පිළිබඳ විස්තර කරන්න.

.................................................................................................................................................................................

.................................................................................................................................................................................

.................................................................................................................................................................................

.................................................................................................................................................................................

(ල. 04)

iii. ගැමියාගේ සුහදශීලී බව ප්‍රකාශ කිරීම සඳහා යොදාගෙන ඇති කාව්‍යෝක්ති 02 ක් ලියා දක්වන්න.

.................................................................................................................................................................................

.................................................................................................................................................................................

.................................................................................................................................................................................

.................................................................................................................................................................................

(ල. 06)

iv. මෙම පද්‍ය පන්තියේ භාෂා ලක්ෂණ පිළිබඳ විමසීමක් කරන්න.

.................................................................................................................................................................................

.................................................................................................................................................................................

.................................................................................................................................................................................

.................................................................................................................................................................................

.................................................................................................................................................................................

.................................................................................................................................................................................

(ල. 06)

# II - පත්‍රය

**සැලකිය යුතුයි.**

**⁎ පළමු ප්‍රශ්නයද 2, 3, 4, 5 ප්‍රශ්න වලින් තෝරාගත් ප්‍රශ්න 02 ක් ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු ලියන්න.**

(01) පහත දී ඇති පැදිපෙළ කියවා අසා ඇති ප්‍රශ්න උපයෝගී කොට ගෙන රසාස්වාදයන් ලියන්න. (පිළිතුරක වචන 200 ක් වත් තිබිය යුතු ය )

පෙරදිග ගොරහැඬි රකුසෝ,
මගේ ධ්‍යානය ඇයි කඩන්නේ
නිදාගන්න පොරවාගත්ත
කලු රෙදි පොට
මොකටද මේ
තීරුවලට ඉරා දමන්නෙ.

කුරුල්ලන්ට ගල් ගහලා
උන් හොඳට ම බිය කරලා
මල් පොහොට්ටු තිගැස්සිලා
කඳුලු හෙලනවා

ඇස් දෙක මම අරින්නේ නෑ
කුරුලු කරන් භාවනාව
නැවතත් යන්නට යනවා
මම
මගේ දහැන ලෝකයට ම

i. මෙම පද්‍ය පන්තියෙහි තේමාව කුමක් ද ?
ii. මෙම පද්‍ය පන්තිය සඳහා යොදාගත් ආකෘතිය පිළිබඳව විමසීමක් කරන්න.
iii. කවි පන්තියේ සඳහන් උත්ප්‍රේක්ෂාලංකාර යෙදුම් දෙකක් උපුටා දක්වා විස්තර කරන්න.
iv. කවි පන්තියේ සඳහන් පරිදි කවියාගේ නින්දට බාධා වූ කරුණු දෙකක් දක්වා විස්තර කරන්න.
v. කවියා භාවිතා කර ඇති භාෂාව පිළිබඳනව ඔබේ අදහස් ඉදිරිපත් කරන්න.

(02) තුංමංහන්දිය නවකතාවේ ලොකු මාමාගේ චරිතය තුළින් ගැමි කලා ශිල්පියෙකුගේ භූමිකාව මැනවින් නිරූපණය වේ. විමසන්න.

(03) තේමාවට අදාළව අවස්ථා සිද්ධි නිරූපණය කරමින් වැලපීම කෙටිකතාව රචනා කර ඇති. උදාහරණ 3 ක් වත් දෙමින් පහදන්න.

(04) "පොදු ජන ජීවිතය මැනවින් නිරූපණය කිරීමට ජන කවිය සමත් වී ඇත." විමසන්න.

(05) සරල අනුභූතියක් පදනම් කරගෙන රචනා කර ඇති වැස්ස පද්‍ය පන්තිය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.